# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2319/41 - 2023 පෙබරවාරි මස 14 වැනි අඟහරුවාදා - 2023.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී.11/80(35).

**1980 අංක 26 දරන ආහාර පනත**

ආහාර උපදේශක කමිටුව විමසා 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කෙහෙළිය රඹුක්වැල්ල,**
සෞඛ්‍ය අමාත්‍ය.

2023 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග "2022 ආහාර (ට්‍රාන්ස්-මේද) නියෝග" යනුවෙන් හඳුන්වනු ලබන අතර 2024 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. යම් තැනැත්තකු විසින්, යම් ඇසුරුම් කරන ලද ආහාර නිෂ්පාදනයක ලේබලයේ එම ආහාර නිෂ්පාදනයේ ග්‍රෑම් 100ක හෝ මිලි ලීටර් 100ක අඩංගු මුළු ට්‍රාන්ස්-මේද ප්‍රමාණය එහි සඳහන් කර ඇත්නම් මිස ට්‍රාන්ස්-මේදය අඩංගු කිසිදු ඇසුරුම් කරන ලද ආහාර නිෂ්පාදනයක් විකිණීම, විකිණීම සඳහා අර්පණය කිරීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ තබා ගැනීම හෝ විකිණීම සඳහා ප්‍රචාරණය කිරීම නොකළ යුතු ය.

3. අපනයනය කිරීමේ අරමුණ සඳහා පමණක් නිෂ්පාදනය කරනු ලබන ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන් මේ නියෝග අදාළ නොවිය යුතුය.


1A - PG 6222 — 4006 (2023/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. යම් තැනැත්තකු විසින්, අවසාන පාරිභෝගිකයා විසින් භාවිත කරනු ලැබීම අරමුණු කරගත් යම් ආහාර නිෂ්පාදනයක අඩංගු ට්‍රාන්ස්-මේද ප්‍රමාණය සත්ත්ව සම්භවයකින් යුත් ස්වභාවිකව හට ගන්නා ට්‍රාන්ස්-මේදය හැර එම ආහාරයේ අඩංගු මුළු මේද ප්‍රමාණයෙන් සියයට දෙකක් ඉක්මවනු ලබන අවස්ථාවක දී එම ආහාර නිෂ්පාදනය සිල්ලර වශයෙන් විකිණීම හෝ තොග වශයෙන් විකිණීම හෝ කරනු නොලැබිය යුතු ය.

5. අවසාන පාරිභෝගිකයන් විසින් භාවිත කරනු ලැබීම අරමුණු කරගත් වෙනත් ආහාර නිෂ්පාදනයන්හි නිෂ්පාදකයන් සඳහා අමුද්‍රව්‍ය ලෙස යම් ආහාර නිෂ්පාදන සැපයීමෙහි නිරත යම් තැනැත්තකු විසින් එම ආහාර නිෂ්පාදනයේ අඩංගු ස්වභාවිකව හටගන්නා සත්ත්ව සම්භවයකින් යුත් ට්‍රාන්ස්-මේද නොවන ට්‍රාන්ස්-මේද ප්‍රමාණය එම ආහාරයෙහි අඩංගු මුළු මේද ප්‍රමාණයෙන් සියයට දෙකක් ඉක්මවනු ලබන අවස්ථාවක දී, එම ට්‍රාන්ස්-මේද ප්‍රමාණය පිළිබඳ තොරතුරු අදාළ නිෂ්පාදකයා වෙත සපයනු ලැබිය යුතු ය.

6. යම් තැනැත්තකු විසින්, යම් අර්ධ වශයෙන් හයිඩ්‍රජනීකරණය කරන ලද තෙල් වර්ග නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, ප්‍රවාහනය කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ තබා ගැනීම හෝ විකිණීම සඳහා ප්‍රචාරණය කිරීම කරනු නොලැබිය යුතු ය.

7. යම් තැනැත්තකු විසින්, ආහාර පිළියෙල කිරීමේ දී හෝ ආහාර නිෂ්පාදනවල අමුද්‍රව්‍යක් ලෙස හෝ අර්ධ වශයෙන් හයිඩ්‍රජනීකරණය කරන ලද තෙල් වර්ග භාවිත කරනු නොලැබිය යුතු ය.

එසේ වුව ද, අයඩින් අගය 4ට වැඩි ස්වභාවිකව හටගන්නා ට්‍රාන්ස්-මේද සහිත යම් ආහාරයක් හෝ ආහාර අමුද්‍රව්‍යක් හයිඩ්‍රජනීකරණය කර ඇති විට සහ සම්පූර්ණ වශයෙන් හෝ ආසන්න ලෙස සම්පූර්ණ වශයෙන් එය සංතෘප්ත නොවන්නේ නම් ද මිස, එහි අර්ධ වශයෙන් හයිඩ්‍රජනීකරණය කරන ලද තෙල් වර්ග අඩංගු ලෙස සලකනු නොලැබිය යුතු ය.

8. මේ නියෝගවල –

"අවසාන පාරිභෝගිකයා" යන්නෙන්, නිමි ආහාර නිෂ්පාදන භාවිත කරනු ලබන හෝ පරිභෝජනය කරනු ලබන යම් තැනැත්තකු අදහස් වේ ;

"ස්වභාවිකව හටගන්නා ට්‍රාන්ස්-මේද" යන්නෙන්, සත්ත්ව සම්භවයකින් යුත් මේදයෙහි ස්වභාවිකව හටගන්නා ට්‍රාන්ස්-මේද අදහස් වේ ;

"අර්ධ වශයෙන් හයිඩ්‍රජනීකරණය කරන ලද තෙල් වර්ග (PHO)" යන්නෙන්, හයිඩ්‍රජනීකරණය කර ඇත්තා වූ ද සම්පූර්ණ වශයෙන් හෝ ආසන්න ලෙස සම්පූර්ණ වශයෙන් සංතෘප්ත නොවන්නා වූ ද 4ට වැඩි අයඩින් අගයක් ඇත්තා වූ ද මේද වර්ග සහ තෙල් වර්ග අදහස් වේ ;

"ට්‍රාන්ස්-මේද" යන්නෙන්, අසංතෘප්ත මේද ආකාරයක් අදහස් වන අතර, ඊට -

(අ) සත්ත්ව සම්භවයකින් යුත් මේදයෙහි ස්වභාවිකව හටගන්නා ට්‍රාන්ස්-මේද ; සහ

(ආ) (අ) ඡේදයේ සඳහන් ට්‍රාන්ස්-මේද නොවන ට්‍රාන්ස් මේද,

ද ඇතුළත් වේ.

EOG 02 - 0151

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.